අධිවේගී මාර්ගවල ධාවනය කරන අධි සුඛෝපභෝගී බස් රථ සේවාව සඳහා පිරිවිතර මාලාව.

1. හිස රඳවන සහ අත් රඳවන සහිත එහා මෙහා කළ හැකි සුවපහසු ආසන තිබිය යුතුය.

2. බෝතල් රඳවන, සඟරා රඳවන සහ කියවීමේ විදුලි බුබුළු සහිත ආසන විය යුතුය.

3. ආසනයක පළල අවම මිලිමීටර් 420ක් විය යුතුය.

4. ඉදිරිපස අසුනේ පිටුපස සිට පසුපස අසුනේ ඉදිරිපස දක්වා තිරස් පරතරය අවම වශයෙන් මිලිමීටර් 680ක් විය යුතු අතර ඉදිරිපස අසුනේ පසුපස සිට පසුපස අසුනේ කුෂන් එක දක්වා පරතරය (දණහිස් පරතරය) මිලිමීටර් 300ක් විය යුතුයි.

5. ආසන 2ක් අතර පහළ කොටසේ තිරස් පරතරය මිලිමීටර් 750ට අඩු නොවිය යුතුය.

6. ද්විත්ව ආරක්ෂිත ආසන පටි තිබිය යුතුය.

7. හකුළන ආසන නොතිබිය යුතුය.

8. අවම මගී ආසන සංඛ්‍යාව ආසන 40ක් විය යුතුයි.

9. ආසන අංකනය කර තිබිය යුතුය.

10. මගීන්ට හැසිරවිය හැකි පා රඳවන තිබිය යුතුය.

11. බෝතල් ශීතකරණයක් තිබිය යුතුය.

12. අවම අඟල් 17LCD/LED රූපවාහිනී තිරයක් තිබිය යුතුය

13. බස් රථයේ ඇතුළත ඉහල කොටසේ සවි කරන ලද තනි තනිව වෙනස් කළ හැකි පහසුකම් සහිත වායු සමීකරණ පද්ධතියක් සමන්විත විය යුතු අතර එහි උෂ්ණත්වය ආසන මට්ටමේදී 20.C වඩා අඩු කළ හැකි විය යුතුය

14. සෑම මගියෙකුටම පැහැදිලිව දර්ශනය වන ඔරලෝසුවක් තිබිය යුතුය.

15. දම්පාට පසුබිමේ සුදු පාට අකුරින් යුත් නිසි ලෙස ආලෝක කරන ලද මිලිමීටර් 300ක් උස මිලිමීටර් 1500ක් පළල LED ගමනාන්ත පුවරු ඉදිරිපස හා පසුපස සවි කළ යුතුය.

16. බස් රථයේ එන්ජිමේ වේගය උපරිම වන අවස්ථාවේදී,

    i. සයිලන්සරයේ සිට මීටර් 5 දුරකදී ශබ්ද මට්ටම 85db වඩා වැඩි නොවිය යුතුය.

    ii. බසයේ ඇතුලත ශබ්ද මට්ටම 80db ට වැඩි නොවිය යුතුය.

    iii. බස් රථයේ නළාවේ ශබ්දය ඉදිරි පස ස්වාරක්ෂකයේ (බෆරයේ) සිට මීටර් 2 ක දී 105db ට වැඩි නොවිය යුතුය.

17. ආරක්ෂිත අඳුරු විදුරු සහිත විවෘත කළ නොහැකි ජනේල තිබිය යුතුය.

18. ආසනවලට ඉහලින් පාර්සල් රාක්ක සවිකර තිබිය යුතුය.

19. බස් රථයේ යට භාණ්ඩ බහාලුම ඝන මීටර් 3 කට නොඅඩු විය යුතුය.

20. වායු පීඩනය භාවිතා කරන ස්වයංක්‍රිය ක්‍රියාත්මක කළ හැකි දොරටුව තිබිය යුතුය.

21. හදිසි දොරටුව ,1983 ජූනි 03 වන දින අංක 248 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශිත මෝටර් වාහන පනතේ සඳහන් ප්‍රමිතීන් වලට අනුකූල විය යුතුය.

22. වායු බැලූන් 06ක් සහිත පැද්දුම් පද්ධතියකින් සමන්විත විය යුතුය.

23. බස් වැසිය සමඟ ආරක්ෂිත වානේ බොඩිය තිබිය යුතුය.

24. වේග පාලන යන්ත්‍රයක් සහිත (Retarded mechanism ) ABS තිරිංග පද්ධතියකින් සමන්විත විය යුතුය.

25. බස් රථයේ එන්ජිම පිටුපස ස්ථාපිත කර තිබිය යුතුය.

26. පසුපස කැමරා පද්ධතිය තිබිය යුතුය.

- ඉහත සඳහන් කළ පිරිවිතරයන්ට අමතරව මෝටර්රථ ප්‍රවාහන පනතේ සඳහා විධිවිධාන ද අදාල වේ.

සැ.යු. බස් කර්මාන්තයේ වර්තමාන තත්වය සැලකිල්ලට ගෙන දැනට අධිවේගී මාර්ග වල ධාවනය කරන අධි සුඛෝපභෝගී මගී සේවා අවසර පත්‍රයන්ට යොදවා ඇති බස් රථසඳහා ඉදිරි වසර පහක කාලසීමාවක් අතුලත ඉහත සඳහන් පිරිවිතර මාලාවට අනුකූල බස් රථ යෙදවීම අනිවාර්ය වේ.